**ශ්‍රම වාසනා අරමුදල- 2013**

--------------------------------

ශ්‍රම වාසනා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

## 2.1 විගණන මතය

----------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණු
අතර වර්ෂය තුළදී මිලදී ගත් රු.297,100ක් වටිනා වත්කම් මිලදී ගත් දිනය නොසලකා ක්ෂය කිරීම නිසා රු.14,785ක් වැඩියෙන් ක්ෂය කර තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේ මිලදී ගන්නා ලද ශබ්ද පද්ධති (sound system) සහ වීඩියෝ කැමරා වැනි වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නිසි පරිදි තීරණය කිරීමකින් තොරව සියයට 10 බැගින් ක්ෂය කර තිබුණි.

## 2.3 නීති,රීති,රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත | |
| (i) 6(ඉ) වගන්තිය | ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ සැපයීමකළ යුතු වුවද ප්‍රතිලාභ සපයා නොතිබුණි. |
| (ii) 13(1) වගන්තිය | එක් එක් වර්ෂයේ මුද්‍රණය කළ යුතු ලොතරැයි සංඛ්‍යාව හා වර්ගය පිළිබඳව ලොතරැයි මණ්ඩලය සමඟ එකගත්වයකට පැමිණිය යුතු වුවද එකඟතාවයකට පැමිණ නොතිබුණි . |
| (iii) 13(2) වගන්තිය | ලොතරැයියෙන් ප්‍රධානය කරන තෑගි පිළිබඳව හා හිමිකම් නොවූ තෑගි පිළිබඳව තහවුරු කළ ආකාරය පිළිබඳවද ලොතරැයි මණ්ඩලය සමඟ එකඟත්වයකට පැමිණිය යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (iv) 13(3) වගන්තිය | ලොතරැයියෙන් ප්‍රදානය කළ යුතු තෑගීවල වටිනාකම්ද ඇතුළුව ලොතරැයි මණ්ඩලය විසින් දැරියයුතු වියදම් සම්බන්ධයෙන් අරමුදල හා ලොතරැයි මණ්ඩලය සමඟ එකඟත්වයක් ඇතිකර ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (v) 10(ඇ) වගන්තිය | ලොතරැයි පැවැත්වීමෙන් ලැබෙන ආදායම් අරමුදලට ලැබිය යුතු වුවත් 2008 ඔක්තෝබර් මාසයෙන් පසුව එම ආදායම් මහා භාණ්ඩාගාරයෙන් ලබා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායම රු. 229,456,751 ක් විය. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3 වෙනි උපලේඛනයේ 2.1 ඡේදය | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2002 දෙසැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.57,537,862 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,201,339 ක් වූයෙන් රු.10,336,523 ක මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 6.18 කින් වැඩි වුවත්, සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 16.5 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා ලද ආදායමෙන් සියයට 80.20 ක ප්‍රමාණයක් ඉතිරි කර තිබූ අතර අරමුදලේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් වැය කර ඇත්තේ මුළු ආදායමෙන් සියයට 14.49 ක ප්‍රමාණයක් පමණක් බව නිරීක්ෂණය විය.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නීති ආධාර ලබාදීමේ වැඩසටහන හා ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා වර්ෂය තුළ ඉලක්ක ගත කර තිබූ ප්‍රතිලාභීන් ගණන 200 දෙනෙකු පමණක් වන අතර, ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ ශ්‍රම බලකාය හා සැසඳූ විට එය ප්‍රමාණවත් නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) සැලසුම් කළද කාර්මික අනතුරු පිළිබඳ වෛද්‍ය සහන සේවා වැඩසටහන / කාර්මික සෞඛ්‍ය සහ ප්‍රදාන, මූල්‍යාධාර හෝ වියළි සලාක වැඩසටහන (Medical assistance Programs Industrial accidents/Industrial Health & Awards, Financial Aid or Dry ration Work) වර්ෂය ඇතුළත ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කළ පනතක් අනුව පිහිටවූ මෙම ආයතනයේ ප්‍රතිලාභ දිවයින පුරා සේවයේ නියුතු සියළු සේවකයින්ට පනතේ අරමුණු ප්‍රකාරව සේවා සැපයීම ආයතනයේ ප්‍රධානම කටයුත්තක් විය. පසුගිය වර්ෂ කිහිපය තුළදී හා මෙම වර්ෂයේදී අදාළ ආයතනයේ ප්‍රතිලාභ වලින් සියයට 75 කට වැඩි ප්‍රමාණයක් ලබාදී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවකයන්ට වීමෙන් ආයතනයේ අරමුණු ළඟාකර ගැනීමේදී දීප ව්‍යාප්ත සේවයක් ඉටුකිරීමට පසුගිය වර්ෂ කිහිපය තුළදී මෙන්ම මෙම වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.

**4.2 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

නීති ආධාර ක්‍රමය ප්‍රචාරණය සඳහා රු. 169,680 ක් වැයකර තිබුණු අතර ලබාදී තිබූ ආධාර ප්‍රමාණය රු. 50,000 කි. ආධාර ලබාදීමේදී රු.15,000 කට වඩා අඩු මාසික වැටුප් ලබන සේවකයන් පමණක් සලකා බැලීම හේතු කොටගෙන මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

**4.3 වියිමත් පරිදි පවරා නොගත් කාර්යාල ගොඩනැගිල්ල**

---------------------------------------------------

කාර්යාල ගොඩනැගිල්ලේ නිත්‍යානුකූල අයිතිය විගණන දිනය දක්වා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රමවාසනා අරමුදලට පවරා දීමට කටයුතු කර නොතිබූ අතර ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු කුළිය, ජල හා විදුලි වියදම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව සමඟ එකඟත්වයකටද එළඹ නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය මඟින් පත්කර නොතිබූ බැවින් ප්‍රවර්තන වර්ෂය තුළ කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ. අරමුදල් කළමනාකරණය.

ආ. කාර්යසාධනය

ඇ. අභ්‍යන්තර විගණනය.